# රණවරුණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ප්‍රකාශනයකි

53 වන කලාපය
2025 අප්‍රියෙල් - ජූනි

RANAWARUNA



# පරිණත නායකයෙකුගේ සම්ප්‍රාප්තිය ...





# ස්වේච්ඡා බළසේනාවේ 61 වන සේනාවිධායතුමන් රාජකාරි භාරගනී





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 61 වන සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් කේ වී එන් පී ප්‍රේමරත්න RSP USP nps psc නිලධාරීතුමන් ජූනි මස 26 වන දිනට යෙදුණු සුබ මොහොතින් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් රාජකාරී භාර ගන්නා ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාර විසින් නව සේනාවිධායකතුමන් පිළිගත් අතර ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා භට පිරිස් විසින් කඳවුරු මුරයකින් හා අභිමානවත් සම්මාන මුරයකින් එතුමන් වෙත ගෞරවය පුද කළහ. කපිතාන් සාලිය අලදෙනිය ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වූ නව සේනාවිධායකතුමන් තම රාජකාරී භාරගැනීම සනිටුහන් කරමින් පැළ රෝපණයක්ද සිදුකරන ලදී. දීර්ඝ යුද්ධ හමුදා සේවා කාලය තුළ ක්‍රියාන්විත මෙන්ම අණ හා මාණ්ඩලික රාජකාරී අත්දැකීම් සහිත ඔබතුමන්, ස්වේච්ඡා බළසේනාවේ ඉදිරි ප්‍රගමනයට නායකත්වය සපයනු ඇතැයි අපේක්ෂා කරන අතර, නව සේනාවිධායකතුමනි, ඔබතුමන්ට රණවිරුණ ඔස්සේ මෙසේ සුභාශිංසන එක්කර සිටිමු.











# 60 වන සේනාවිධායකතුමන්ගේ

## ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) සංචාරය ....

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc විසින් අප්‍රියෙල් මස 28, 29 සහ 30 දිනයන්හිදී ආරක්ෂක සේනා මූලස්ථානය - යාපනය යටතේ ස්ථාපිත ස්වේච්ඡා ඒකක වෙත නිරීක්ෂණ සංචාරයක නිරත විය. අප්‍රියෙල් මස 28 වන දින 9 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙතද 29 වන දින 10 වන විජයබාහු පාබල රෙජිමේන්තුව වෙතද 14 වන සහ 15 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව වෙතද 30 වන දින 11 වන ගජබා රෙජිමේන්තුව හා 2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව වෙතද සංචාරය කරන ලදී. එහිදී ඒකක අණදෙන නිලධාරීවරුන් විසින් සේනාවිධායකතුමන්ව ඉතාමත් උණුසුම්ව පිළිගන්නා ලදී.

එම සංචාරයේදී ස්වේච්ඡා බලසේනා සේනාවිධායකතුමන් විසින් හටපිරිස් අමන්ත්‍රණය කරමින් තිරසාර අනාගතයක් නිර්මාණය කිරීම අරමුණු කරගත් "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනේ වැදගත්කම පිළිබඳව අවධාරණය කළේය. සිය දේශනයේදී මත්ද්‍රව්‍ය භාවිතය, සූදුව වැනි හානිකර ක්‍රියාවන්ගෙන් වැළකී සිටීම සහ හමුදාවේ විනය ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව සිය අදහස් දැක්වීය. මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය යාපනය බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ, කර්නල් සම්බන්ධීකරණ නිලධාරීන් ඇතුළු ස්වේච්ඡා බලසේනාවට අයත් ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.













## ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා විශේෂ වැඩමුළුවක් ...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක ඩී කේ එස් කේ දොලගේ USP nps psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ගේ සංකල්පයක් අනුව ස්වේච්ඡා බළසේනාව යටතේ සිටින නිලධාරීන්ගේ ඵලදායීතාව වැඩිකරමින් කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමේ අරමුණු පෙරදැරිව ආරක්ෂක සේනා මූලස්ථානයන්හි රාජකාරී කරනු ලබන බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරීන් සහ කර්නල් සම්බන්ධීකරණ නිලධාරීන් විසිඅට දෙනෙකු සඳහා විශේෂ වැඩමුළුවක් අප්‍රියෙල් මස 07 සහ 08 යන දිනවලදී ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී පවත්වනු ලැබීය.

ස්වේච්ඡා බළසේනා මූලස්ථාන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මෙහිදී දේශන කිහිපයක් සිදුකළ අතර කැපවීම, සහ ක්‍රියාකාරී සහභාගිත්වය අගයමින්, බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරීන් සහ කර්නල් සම්බන්ධීකරණ නිලධාරීන් වෙත සහතිකපත් ප්‍රදානයක්ද සේනාවිධායකතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදු විය. මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බළසේනා වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර, මූලික මාණ්ඩලික නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.






## රෙජිමේන්තු සම්බන්ධීකරණ නිලධාරීන් සහ අණදෙන නිලධාරීන් සඳහා විශේෂ වැඩමුළුවක් ...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ගේ සංකල්පයකට අනුව ස්වේච්ඡා බළසේනාවේ සියලුම නිලධාරීන්ගේ දැනුම, කාර්යක්ෂමතාව හා වෘත්තීය නිපුණත්වය වර්ධනය කිරීම අරමුණු කරගනිමින් රෙජිමේන්තු සම්බන්ධීකරණ නිලධාරීන් සහ අණදෙන නිලධාරීන් සඳහා විශේෂ වැඩමුළුවක් මැයි මස 21 සහ 22 යන දිනයන්හිදී ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී පවත්වනු ලැබීය.


ස්වේච්ඡා බළසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාර, පුහුණු පරීක්ෂක බ්‍රිගේඩියර් බී ජේ ලේකම්ගේ RSP KSP, බ්‍රිගේඩියර් පාලන බ්‍රිගේඩියර් එච් ඒ කීර්තිනාථ RSP KSP psc හා බඳවා ගැනීමේ නිලධාරී කර්නල් අයි යූ කේ වත්තේගෙදර ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙහිදී දේශන කිහිපයක් පැවැත්වූ අතර, රෙජිමේන්තු සම්බන්ධීකරණ නිලධාරීන් හා අණදෙන නිලධාරීන් වෙත සහතික පත් ප්‍රදානය නියෝජ්‍ය සේනාවිධායකතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදු විය. මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බළසේනා වේ අනෙකුත් ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.





# ස්වේච්ඡා බළසේනා මූලස්ථාන බක්මහ උළෙල



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ රාජකාරී කරනු ලබන ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන්, නිලධාරිණියන්, සෙසු නිලයන්, සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙනුවෙන් සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිති කොටගෙන සංස්කෘතික හා සාම්ප්‍රදායික ජන ක්‍රීඩා වලට මුල් තැන දෙමින් අලුත් අවුරුදු උත්සවයක් අප්‍රියෙල් මස 09 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc සහ එම මැතිණියගේ ප්‍රධානත්වයෙන් ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේදී පවත්වනු ලැබීය. වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර සහ එම මැතිණියද සහභාගී වූහ.



සමාරම්භක උත්සවය ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර සහ එම මැතිණියගේ සහභාගීත්වයෙන් පැවැත්වූ අතර, පොල්තෙල් පහන් ඒකාලෝක කරමින් අලුත් අවුරුදු උත්සවය ආරම්භ කරන ලදී.



මෙම අලුත් අවුරුදු උත්සවය සඳහා කොට්ට පොර, වාසනා මුට්ටිය බිඳීම, කඹ ඇදීමේ තරග සහ සංගීත පුටු තරගය ඇතුළු සාම්ප්‍රදායික ජන ක්‍රීඩා රාශියක් ඇතුළත් වූ අතර, දරුවන් සඳහා බනිස් කෑම, බැලූන් පිපිරවීම, අලියාට ඇස තැබීම සහ සංගීත පුටු තරගය වැනි තරඟ ඉසව්ද සංවිධානය කර තිබිණි.



අවුරුදු උත්සවයේ කැපී පෙනෙන අංගයක් වන අවුරුදු කුමාරිය සහ කුමරා තේරීමේ තරගය ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායකතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එසේම එතුමන්ගේ සුරතින් තරඟ ජයග්‍රාහකයින් වෙත තෑග්ග ප්‍රදානය සිදුකරන ලදී.



එමෙන්ම සේනාවිධායකතුමන් විසින් අලුත් අවුරුදු සැමරුම වෙනුවෙන්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ සේවයේ නියුතු සියලුම සාමාජිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සියලු දෙනා හට අවුරුදු සුබ පැතුම් එක් කළේය.

මෙම අවස්ථාවට මූලික මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් ඒ එම් සී අබේකෝන් RWP RSP USP ndc ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, නිලධාරිණියන්, සෙසු නිලයින්, සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ද සහභාගී වූහ.











# ස්වේච්ඡා බළසේනා නිලධාරී නිවස්නය ප්‍රතිසංස්කරණයෙන් පසු විවෘත වූ වගයි



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ නිලධාරී නිවස්නය නවීකරණය කර විවෘත කිරීම ජුනි මස 05 වන දින ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ගේ සුරතින් සිදුකරන ලදි.



මෙහි නවීකරණ කටයුතු ස්වේච්ඡා බළසේනා මූලස්ථාන බළඇණියේ සහ ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සෙබින්ගේ ශ්‍රම දායකත්වයෙන් සිදු විය. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාර, මූලික මාණ්ඩලික නිලධාරී මේජර් ජෙනරාල් ඒ එම් සී අබේකෝන් RWP RSP USP ndc ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් සහ නිලධාරිනියන් පිරිසක් සහභාගි වූහ.





# සේනාවිධායකතුමන්ගේ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සංචාරය ...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc මැයි මස 15 වන දින කුරුණෑගල පිහිටි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත හා එම රෙජිමේන්තුවට අයත් 9 වන බළඇණිය වෙත සංචාරයක නිරත විය. එහිදී ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු භට පිරිස් විසින් සඳවුරු ආරක්ෂක මුරයකින් හා සම්මාන පෙළපාලියකින් එතුමන් වෙත ගෞරවය පුද කළ අතර, රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් වල් ඩබ්ලිව් එස් ආර් වෙත්තසිංහ විසින් සේනාවිධායකතුමන් උණුසුම් ලෙස පිළිගන්නා ලදි.





එහිදී මියගිය රණවිරුවන් සිහිපත් කරමින් රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වූ ස්වේච්ඡා බලසේනා සේනාවිධායකතුමන් "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනෙහි වැදගත්කම සහ එය සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කරමින් භටපිරිස් අමතා හරවත් දේශනයක් සිදුකරන ලදී. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.







# යුද්ධ හමුදාධිපතිතුමන්ගේ

## ස්වේච්ඡා බළසේනා මූලස්ථාන සංචාරය...






ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා 144 වන සංවත්සරයට සමගාමීව, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් බී කේ ජී එම් එල් රොද්‍රිගෝ RSP ctf-ndu psc IG අප්‍රියෙල් මස 08 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ සංචාරයක නිරත විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc විසින් යුද්ධ හමුදාධිපති උණුසුම් ලෙස පිළිගනු ලැබීය. කපිතාන් සාලිය අලදෙණිය රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වූ යුද්ධ හමුදාධිපතිතුමන් වෙත ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ භට පිරිස් විසින් අලංකාරවත් සම්මාන මුරයක් පිරිනමන ලදී. ස්වේච්ඡා බළසේනාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි යුද්ධ හමුදාධිපතිතුමන් සංචාරය සිහිවීම පිණිස මූලස්ථාන කඳවුරු පරිශ්‍රයේ පැළයක් රෝපණය කරන ලදී. සේනාවිධායකතුමන් විසින් පිළිගැනීමේ කතාව සිදුකළ අතර රැස්ව සිටි 500කට අධික භට පිරිස් අමතා යුද්ධ හමුදාධිපතිතුමන් එකිනෙකාට ගරු කරමින් හා නියෝග පිළිපදිමින් සහයෝගයෙන් රාජකාරී ඉටු කිරීමේ හා "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනෙහි වැදගත්කම පිළිබඳව අදහස් ප්‍රකාශ කරන ලදී.

එසේම මෙම අවස්ථාවේදී සේනාවිධායකතුමන් විසින් 144 වන විශේෂ සංවත්සර කලාපය ලෙස "රණවිරුණ" සඟරාවේ 52 වන කලාපයේ මංගල පිටපත යුද්ධ හමුදාධිපතිතුමන් වෙත පිළිගැන්වීය.



# නිලධාරීන් සඳහා "ඩයිනර්ස් ක්ලබ්" පුහුණු සැසිය...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ගේ මඟපෙන්වීම මත මූලස්ථාන නිලධාරීන් වෙනුවෙන් පුහුණු දින වැඩසටහනක් ජූනි මස 05 වන දින ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේදී පැවැත්විය.

එහිදී පැවැත්වූ "ඩයිනර්ස් ක්ලබ්" සැසිය සඳහා ආරාධිත දේශකයෙකු ලෙස සහභාගී වූ කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අසන්ත සෙනෙවිරත්න මහතා විසින් "ඉන්දු - පකිස්ථාන, ඊශ්‍රායල - පලස්තීන, හා යුක්‍රේන - රුසියා යන යුධ ගැටුම් සහ ශ්‍රී ලංකාවට එමගින් ඇති වන බලපෑම" යන මාතෘකාව පාදක කර ගනිමින් විශේෂ දේශනයක් සිදු කළේය. ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාර ගේ අධීක්ෂණය යටතේ සිදුකළ මෙම වැඩසටහන සඳහා ස්වේච්ඡා බලසේනා මූලික මාණ්ඩලික නිලධාරී වූ මේජර් ජෙනරාල් ඒ එම් සී අබේකෝන් RWP RSP USP ndc ඇතුළු ජ්‍යේෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

## විශ්‍රාම ගිය ජ්‍යෂ්ඨ නිලධාරීන්ට ස්වේච්ඡා බලසේනාවේ ආචාරය ...





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ දීර්ඝකාලීන සක්‍රිය සේවයකින් පසුව විශ්‍රාම ලැබූ බ්‍රිගේඩියර් එස් කේ එම් එම් එන් කේ මහත්තේ KSP බ්‍රිගේඩියර් ඩබලිව් ටී එම් පී එස් බණ්ඩාර සහ කර්නල් එම් ඒ ලක්ෂ්මන් RSP යන ජ්‍යේෂ්ඨ නිලධාරීන් ජූනි මස 06 වන දින ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේදී ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc හමුවිය.



මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාර, මූලික මාණ්ඩලික නිලධාරී මේජර් ජෙනරාල් ඒ එම් සී අබේකෝන් RWP RSP USP ndc ඇතුළු ජ්‍යේෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ. හමුදා නිලධාරියෙක් ලෙස මාතෘභූමියට අනුපමේය සේවයක් ඉටුකොට විශ්‍රාම දිවියට පා තැබූ ඔබට රණවිරුණා ඔස්සේ මෙමේ සුභාශිංසන එක් කරන්නෙමු.

# සේනාවිධායකතුමන්ගේ ඒකක සංචාර...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc විසින් මැයි මස 08 සහ 09 දිනයන්හිදී 4 වන ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව හා 2 වන ශ්‍රී ලංකා පොදු සේවා බළකාය යන ස්වේච්ඡා ඒකක වෙත නිරීක්ෂණ සංචාරයක නිරත විය. එහිදී ඒකක අණදෙන නිලධාරීවරුන් විසින් සේනාවිධායකතුමන්ව ඉතාමත් උණුසුම්ව පිළිගන්නා ලදී. සංචාරය තුළදී ඒකක නිලධාරීන් ප්‍රමුඛ භටපිරිස් ආමන්ත්‍රණය කළ සේනාවිධායකතුමන් රජය විසින් මෙහෙයවනු ලබන "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනේ වැදගත්කම පිළිබඳව විශේෂයෙන් අවධාරණය කළේය. සිය දේශනයේදී මත්ද්‍රව්‍ය භාවිතය, මාර්ගගත සූදුව වැනි හානිකර ක්‍රියාවන්ගෙන් වැළකී සිටීම සහ හමුදා විනය ආරක්ෂා කිරීමේ වැදගත්කම ද අවධාරණය කළේය.

සේනාවිධායකතුමන් විසින් එම ඒකක වල සමරු සටහන් තැබූ අතර ඒකක වෙතින් සූදානම් කර තිබූ සියලු නිල හේ පැන් සංග්‍රහයන්ටද එක්විය. මෙම අවස්ථා සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරී, කර්නල් සම්බන්ධීකරණ නිලධාරීන් සහ අණදෙන නිලධාරීන් මෙන්ම ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් ද සහභාගී වූහ.









# මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබ ...







ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් බී එම් ආර් ජේ බණ්ඩාර මේජර් ජෙනරාල් නිලය දක්වා උසස් කිරීම ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ RSP CTF - ndu psc IG ගේ ආශිර්වාද මධ්‍යයේ පසුගියදා සිදු කරන ලදී. 2 වන බලඇණිය (ස්වේච්ඡා) විජයබාහු පාබල රෙජිමේන්තුවෙන් බිහි වූ කීර්තිමත් නිලධාරියෙකු වූ මෙතුමන් 1990 ජනවාරි 25 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳී තම දීර්ඝකාලීන යුද්ධ හමුදා සේවා කාලය තුළ ක්‍රියාන්විත සහ ක්‍රියාන්විත නොවන රාජකාරී ආවරණය කොට ඇති අතර එතුමන් එහිදී අණ, කාර්ය මණ්ඩල සහ උපදේශන භූමිකාවන්හි නායකත්ව ගුණාංග මැනවින්,පෙන්වමින් තම රාජකාරීන් ඉටුකර ඇත. නව නියෝජ්‍ය සේනාවිධායකතුමනි, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව වෙනුවෙන් රණවිරුණ අපිද ඔබතුමන් වෙත සුභාශිංසන එක්කරන්නෙමු.



# මේජර් ජෙනරාල් නිළයට උසස් වූ 34 වන නියෝජ්‍ය සේනාවිධායක, වැඩ භාර ගැනීම





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 34 වන නියෝජ්‍ය සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාර 2025 අප්‍රියෙල් මස 22 වන දින යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් රාජකාරි භාරගන්නා ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා බ්‍රිගේඩියර් පාලන බ්‍රිගේඩියර් බී ජේ ලේකම්ගේ RSP KSP විසින් නව නියෝජ්‍ය සේනාවිධායකතුමන් පිළිගන්නා ලද අතර ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ භට පිරිස් විසින් කඳවුරු ආරක්ෂක මුරයකින් හා අභිමානවත් සම්මාන මුරයකින් ආචාරය පුදකරන ලදී. එතුමන් විසින් කපිතාන් සාලිය අලදෙනිය ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වමින් පසුව ආගමික වතාවත් මධ්‍යයේ සුබ මොහොතින් රාජකාරි භාරගත් නියෝජ්‍ය සේනාවිධායකතුමන් රාජකාරි භාරගැනීම සනිටුහන් කරනු වස් කඳවුරු පරිශ්‍රය තුළ පැළයක්ද රෝපණය කළේය. පසුව එතුමන් විසින් ස්වේච්ඡා බළසේනා මූලස්ථාන භටපිරිස් ආමන්ත්‍රණය කළ අතර සියලු නිල තේ පැන් සංග්‍රහයකට එතුමන් සහභාගී විය. මෙම රාජකාරි භාරගැනීමේ අවස්ථාව සඳහා ස්වේච්ඡා බළසේනා මූලික මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් ඒ එම් ජී අබේකෝන් RWP RSP USP ndc ඇතුළු කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරීවරුන් ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිලයින් විශාල පිරිසක්ද සහභාගී වූහ.





# විරුදරු ප්‍රණාම ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩසටහන 2025 ...

ස්වේච්ඡා සාමාජිකයන්ගේ පවුල්වල දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා විරුදරු ප්‍රණාම ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩසටහන මැයි මස 17 වන දින උත්කර්ෂවත්ව සිදුකරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවට අයත් නිලධාරීන් හා සෙසුනිල සාමාජිකයින්ගේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත්, අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් හා විශ්වවිද්‍යාල වරම් ලැබූ සිසු සිසුවියන් සඳහා 12 වන වරටත් ක්‍රියාත්මක කරන මූල්‍යාධාර ප්‍රදානය ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ දී ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිණි ලිලන්ති දොලගේ මැතිණියගේ ප්‍රධානත්වයෙන් සිදුකළ අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාර සහ එම මැතිණිය ද මේ සඳහා සහභාගී වූහ.

මෙවර මූල්‍යාධාර වැඩසටහන යටතේ සිසුන් 205 දෙනෙකු මූල්‍යාධාර ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර ඉන් විශ්වවිද්‍යාල ප්‍රවේශ ලබාගත් සිසුන් 57දෙනෙකු, අ.පො.ස (සා/පෙළ) සාමාර්ථ 9 ලබාගත් සිසුන් 27දෙනෙකු, ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගත් සිසුන් 16 දෙනෙකු මෙම උත්සවයේදී මූල්‍යාධාර ලබා ගත් අතර මෙහිදී සේනාවිධායකතුමන්ගේ සංකල්පයකට අනුව සාලාව දෙමළ ප්‍රාථමික විද්‍යාලයේ සිසුන් සඳහා පාවහන් ප්‍රධානයක්ද සිදු කෙරිණ.

මෙම වැඩසටහන සඳහා ස්වේච්ඡා බලසේනාවේ රාජකාරියෙහි නියුතු සහ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන්, සෙසු නිලයින්, සාලාව වතුයායේ වතු අධිකාරී, සාලාව දෙමළ ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති මෙන්ම දෙමව්පියන් සහ සිවිල් කාර්ය මණ්ඩල සාමාජිකයන් පිරිසක්ද සහභාගී වූහ.












# නව තනතුරු ලැබ නික්මයන සේනාවිධායකතුමන්ට සුභාශිංසන...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ 60 වන සේනාවිධායක ලෙස රාජකාරි ඉටුකළ මේජර් ජෙනරාල් ඩී කේ එච් කේ දොලගේ USP nps psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස උසස්වීම් ලැබ ජූනි මස 25 වන දින සිය ධූරයෙන් සමුගන්නා ලදී.





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාර විසින් ස්වේච්ඡා බලසේනාවෙන් නික්ම යන සේනාවිධායකතුමන් උණුසුම්ව පිළිගත් අතර හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුර පිරික්සුමකින් ගෞරවය පුදකරන ලදී. කපිතාන් සාලිය අලුතෙනිය ස්මාරකය වෙත පුෂ්පෝපහාර පිරිනැමීමෙන් අනතුරුව සේනාවිධායකතුමන් විසින් හටපිරිස් ආමන්ත්‍රණය කළේය. නික්මයන සේනාවිධායකතුමන් විසින් රාජකාරි භාරදීමෙන් අනතුරුව ස්වේච්ඡා බලසේනා සමරු සටහන් පොතෙහි තම සමරු සටහන තබන ලදී. නව තනතුරු ලැබ ස්වේච්ඡා බලසේනාවෙන් සමුගත් සේනාවිධායකතුමනි ඔබතුමන්ට රණවිරුණ ඔස්සේ මෙසේ සුභාශිංසන එක් කරන්නෙමු.



## 9 (සේවා) ශ්‍රීලපාහ

# සේනාවිධායකතුමන්ගේ ඒකක සංචාරය...





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් 9 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත අප්‍රියෙල් මස 28 වන දින සංචාරයක නිරත විය. එහිදී කඳවුරු මුරයක් පිරිනැමූ අතර, ඒකක අණදෙන නිලධාරී මේජර් පී එල් ඒ වික්‍රමසිංහ විසින් සේනාවිධායකතුමන් උණුසුම්ව පිළිගන්නා ලදී. සේනාවිධායක විසින් ඒකකයේ වත්මන් ක්‍රියාකාරීත්වය පිළිබඳව සොයා බැලූ අතර භට පිරිස් ආමන්ත්‍රණය කළ එතුමන් සමරු සටහන් පොතෙහි සිය අත්සනද තැබීය.

## 17 (සේවා) ශ්‍රීලපාහ

# ඒකක සංවත්සරය සමරමින්...





වව්නියාව පම්පෙමඩුහි ස්ථාපිත 17 වන ශ්‍රී ලංකා පාබල හමුදාව මාර්තු මස 30 වන දිනට යෙදුණු සිය 16 වන ඒකක සංවත්සරය ආගමික වතාවත්වලට මුල් තැන දෙමින් ඉතා උත්කර්ෂවත් අන්දමින් සමරන ලදී. මාර්තු මස 28 වන දින මහා සංඝරත්නය වැඩමවා වරු පිරිත් සජ්ඣායනාවක් සිදු කළ අතර පසු දින මහා සංඝරත්නය වෙනුවෙන් දානමය පිංකමක් සිදුකරන ලදී. මාර්තු මස 30 වන දින ඒකක අණදෙන නිලධාරී මේජර් ඕ ඩී එස් අයි ආර් කේ විතානගේ RSP ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක්ද පිරිනැමූ අතර බළඇණි සංවත්සර දිනය සිහිවීම වස් අණදෙන නිලධාරී විසින් බළඇණි කාර්යාල පරිශ්‍රයේ පැළයක්ද රෝපණය කරන ලදී. එදින සන්ධ්‍යාවේ සියලුම කණ්ඩායම් නියෝජනය වන පරිදි සුහද ක්‍රිකට් තරඟයක්ද පවත්වා බළඇණි සංවත්සරයේ කටයුතු අවසන් කරන ලදී.

19 ශ්‍රීලංජාආබමු

# ශ්‍රද්ධාවෙන් යුතු පුණ්‍ය මහෝත්සවය...






ලෝකවාසී ජනතාව විසින් ශ්‍රද්ධාවෙන් යුතුව වන්දනා මාන කරනු ලබන උතුම් වූ ශ්‍රී පාදස්ථාන වන්දනා සමය 2025 වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයෙන් අවසන් වූ අතර ශ්‍රී පාදස්ථාන උඩමළුවේ ඇති ශ්‍රී සුමන සමන් දේව ප්‍රතිමාව හා සධාතුක කරඬු වහන්සේ සහ දේව ආභරණ 2025.05.13 වන දින උඩමළුවේ සිට නල්ලතන්නිය දක්වා වැඩම කරවීමේ පුණ්‍ය මහෝත්සවය ආසේමු (ම) ආඥාපතිතුමන්ගේ සහභාගිත්වයෙන් හා 11 පාසේමු සේනාංකාධිපතිගේ අධීක්ෂණය මත 642 පාබල බළසේනාවේ බළසේනාධිපතිගේ උපදෙස් මත 19 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් සහ ඒකක භට පිරිස්හි සහභාගීත්වයෙන් නිමා කරන ලදි.

# 144 වන ඒකක සංවත්සර සැමරුම...

2 (සෙවි) ශ්‍රීලපාහ







කැලණිමුල්ල ප්‍රදේශයේ ස්ථාපිත 2 වන ශ්‍රී ලංකා පාබල හමුදාව සිය 144 වන සංවත්සර සැමරුම ඒකක අණදෙන නිලධාරී මේජර් එම් සී ප්‍රසාද් psc ගේ ප්‍රධානත්වයෙන් අප්‍රේල් මස 01 වන දින ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. එහිදී ඒකක අණදෙන නිලධාරී විසින් භටපිරිස් ඇමතීමෙන් අනතුරුව භට පිරිස් හි සුහදතාව වර්ධනය කිරීම උදෙසා ක්‍රිකට් තරඟාවලියක් හා අත්පන්දු තරඟාවලියක් සංවිධානය කරන ලද අතර, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදී.

## 9 (සෙව්) ශ්‍රීලපාහ








# හිසට සෙවණක් දිවියට සවියක්...

9 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ එම ඒකක භට පිරිස් හි ශ්‍රම දායකත්වයෙන් යාපනය දිස්ත්‍රික්කයේ කඩ්ඩුවාන් ප්‍රදේශයේ ජේ/239, කඩ්ඩුවාන් බටහිර ග්‍රාමයේ පදිංචි සෙල්ලම්හි සයාන්තිනි මහත්මියගේ පවුල වෙත අභිනවයෙන් ඉදිකරන ලද නිවස මැයි මස 07 දින ආරක්ෂක සේනා මූලස්ථානය යාපනය ආඥාපති මේජර් ජෙනරාල් වයි ඒ බී එම් යහම්පත් RWP RSP ndu psc විසින් සුබ මොහොතින් විවෘත කර එම පවුල වෙත භාරදෙන ලදී.

## 14 (සෙව්) ගැහේබ

# සාමූහිකත්වය වර්ධනය කරමින් ...









ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ ස්ථාපිත 14 වන ශ්‍රී ලංකා ගැමුණු හේවා රෙජිමේන්තුවේ ඒකක අණදෙන නිලධාරී මේජර් එල් එම් සුරංගගේ සංකල්පයකට අනුව ඒකක සාමාජිකයින් තුළ සාමූහිකත්වය වර්ධනය කිරීම සඳහා ජූනි මස 03 හා 04 දෙදින පුරා බළඇණි කණ්ඩායම් අතර ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වූ අතර, එහි අවසන් තරඟය ජූනි මස 09 දින පවත්වන ලදී. එම තරඟාවලියේ ශූරතාවය දිනා ගැනීමට බළඇණි මූලස්ථාන කණ්ඩායම සමත් විය. අනුශූරතාවය දිනා ගැනීමට සී කණ්ඩායම සමත් වූ අතර, එහිදී තරඟාවලියේ වීරයාට හිමි කුසලානය සෙ/එෆ්101341 පාසෙ මධුවන්ත ආර් එච් එම් අයි ඩී විසින් දිනාගැනීමට සමත් විය. ඔවුනට කුසලාන ප්‍රදානය කිරීම 592 පාබල බලසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් කේ එල් අයි කරුණානායක RWP RSP ndc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ගේ සුරතින් සිදුවිය.

# රන් මාලය අයිතිකරු වෙත ලබා දී...

## 10 (සේවී) ගැසේබ

10 වන ස්වේච්ඡා ගැමුණු සේවා බළඇණියෙහි කාර්යය නියුක්ත අණදෙන නිලධාරී මේජර් ආර් එම් එච් කරුණාරත්න ගැසේබ ජ්‍යෙෂ්ඨ නිලධාරී මන්නාරම මැදවච්චිය ප්‍රධාන මාර්ගයේ සන්ධ්‍යා කාලයෙහි ශාරීරික අභ්‍යාස වල නිරතව සිටින අතරතුර මාර්ග යෙහි වැටී තිබියදී හමුවූ රු: 250,000.00 පමණ වටිනාකමකින් යුත් රන් මාලයක් එහි සැබෑ අයිතිකරු කොක්කුපඩියාන්, සිලාවතුර යන ලිපිනයෙහි පදිංචි එස් මනෝහරන් ක්‍රිශාන්දිනි මහත්මිය බවට තහවුරු කර ගැනීමෙන් පසු ජුනි මස 04 වන දින 10 වන ගැමුණු සේවා බළඇණි කඳවුර සිරිනාටකුලම් හිදී ඇය වෙත භාරදීමට කටයුතු සිදු කරන ලදි.



## 10 (සේවී) ඉසේරෙ







# බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරීතුමන්ගේ කඳවුරු සංචාරය...

ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරී බ්‍රිගේඩියර් එච් මහවිතාන KSP ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් මැයි මස 22 වන දින 10 (සේවී) ඉසේර කඳවුරු සංචාරයක් සිදුකළ අතර, ඒ සඳහා ආසේමු (මධ්‍යම) කර්නල් සම්බන්ධීකරණ නිලධාරී සහ 12 පාසේමු කර්නල් සම්බන්ධීකරණ නිලධාරීන් ද සහභාගී වූහ. එහිදී ඒකක කඳවුරු පරිශ්‍රයට පැමිණි ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් ඇතුලු සියලු නිලධාරීන් ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ආර් පී ඒ රෝහණ USP ඉසේබ ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් උණුසුම් ලෙස පිළිගත් අතර, සිය සංචාරය සිහිවීම පිණිස බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරීතුමන්ගේ සුරතින් අඹ පැළයක් ද රෝපණය කරන ලදි. ඉන් අනතුරුව ඒකකයේ පරිපාලන කටයුතු සොයා බැලූ එතුමන් විසින් භට පිරිස් ඇමතීමක්ද සිදුකරන ලදි.

2 (සේවා) ශ්‍රීලපාහ

## බළසේනාධිපතිතුමාගේ ඒකක සංචාරය ...





144 වන පාබල බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් ජේ එම් ඩබ්ලිව් කේ ජයලත් RWP RSP USP විසින් කැළණිමුල්ල ප්‍රදේශයේ ස්ථාපිත 2 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ජුනි මස 12 වන දින සංචාරයක් සිදුකරන කරන ලදී. එහිදී ඒකක අණදෙන නිලධාරී මේජර් එම් සී ප්‍රසාද් psc විසින් එතුමන්ව පිළිගත් අතර එම සංචාරය සිහිවීම පිණිස පැළයක් රෝපණය කරන ලදී. තවද ඒකකයෙහි හට පිරිස් ඇමතූ එතුමන් සමරු සටහන් පොතේ සටහනක්ද තබමින් ඒකකයේ සියලුම නිලධාරීන් සමඟ සමූහ ඡායාරූපයකටද පෙනී සිටියේය.

1 ශ්‍රීලංරබ

## සුබසාධක වැඩසටහනක් ...

පල්ලෙකැලේ ප්‍රදේශයේ ස්ථාපිත 1 වන රයිෆල් බළකාය විසින් ආරක්ෂක අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක රට දැය වෙනුවෙන් තම ජීවිත පූජාකළ රණවිරුවන් සිහිකරමින් සිදුකරන සුබසාධක වැඩසටහන් මාලාවට සමගාමීව සහල් කිලෝග්‍රෑම් 2600 ක ප්‍රමාණයක් තම බළ ප්‍රදේශයේ සිවිල් පුද්ගලයින් 1075 ක් වෙත බෙදාදීම ජුනි මස 10 වන දින ඒකක අණදෙන නිලධාරී ශූතිනන් කර්නල් ඩබ්ලිව් එම් පී එල් පී වීරකෝන් ගේ ප්‍රධානත්වයෙන් සිදු විය. ප්‍රදේශයේ ධනපතියන්ගේ මූල්‍ය දායකත්වය මත හා ඒකක සියලු නිලයින්ගේ දායකත්වයෙන් මෙම සත් ක්‍රියාව සිදුකලහ.





2 (සේවා) ගැහේබ







## බංග්ලාදේශ යුද්ධ හමුදා සාමාජිකයින් ගාලුකොටුවේ සංචාරයක ...

බංග්ලාදේශ යුද්ධ හමුදාවට අයත් නිලධාරීන් 14 දෙනෙකු සහ සෙසුනිලයින් 27 දෙනෙකු විසින් ශ්‍රී ලංකාවේ සිදුකළ සංචාරය අතර තුර ගාල්ල කොටුවේ ස්ථාපිත 2 (සේවා) ගැමුණු හේවා බළඇණිය වෙත අප්‍රියෙල් මස 25 වන දින පැමිණෙන ලදී. එහිදී 573 පාබසේමු බළසේනාධිපති බ්‍රිගේඩියර් එස් ඩබ්ලිව් පී එම් එච් ආර් සේනාධීර RWP USP psc හා ඒකක අණදෙන නිලධාරී මේජර් එස් එම් එල් එල් ද සිල්වා යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් එම පිරිස උණුසුම්ව පිළිගත් අතර ගාල්ල කොටුව සහ ඒකක බලප්‍රදේශයට අයත් ස්ථානයන්හි නිරීක්ෂණ සංචාරයකද නිරත වූහ.

3 (සේවා) ශ්‍රීලංසිරෙ

## සේනාංකාධිපතිගේ කඳවුරු සංචාරය...








11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේ ඒ යූ කොඩිතුවක්කු USP psc IG විසින් නුවරඑළිය ප්‍රදේශයේ ස්ථාපිත 3 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙත ජූනි මස 06 වන දින සංචාරයක් සිදුකරන ලදී. එහිදී ඒකක අණදෙන නිලධාරී මේජර් එච් රත්නායක විසින් එතුමන්ව උණුසුම්ව පිළිගත් අතර සංචාරය සිහිවනු වස් පැළයක් රෝපණය කළේය. තවද හටපිරිස් ඇමතූ එතුමන් ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් සමග සමූහ ඡායාරූපයකටද පෙනී සිටියේය.

6 (සේවා) සබුබ

## කඳවුරු සංචාරය...







ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් රාජකාරී කරනු ලබන බ්‍රිගේඩියර් එන් මහවිතාන KSP ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් මැයි මස 22 වන දින 6 (සේවා) සබුබ කඳවුරු සංචාරයක් සිදුකරන ලදී. ඒ සඳහා ආසේමු (මධ්‍යම) කර්නල් සම්බන්ධීකරණ කර්නල් ඒ ටී හජ්ජි, 12 පාසේමු කර්නල් සම්බන්ධීකරණ කර්නල් එච් එච් පී සී හල්පගේ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද සහභාගී වූහ. එහිදී ඒකක කඳවුරු පරිශ්‍රයට පැමිණි ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරී ඇතුළු සියලු නිලධාරීන් ඒකක අණදෙන නිලධාරී මේජර් ඩබ් ඒ එස් එන් යාපා USP psc lsc සබුබ ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් උණුසුම් ලෙස පිළිගත් අතර එම සංචාරය සිහිවීම වස් ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සුරතින් අඹ පැළයක්ද රෝපණය කරන ලදී.

තවද ඒකකයේ පරිපාලන කටයුතු සොයා බැලූ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් විසින් හටපිරිස් ඇමතීමක්ද සිදුකරන ලදී.



## 17 (සෙව්) ශ්‍රීලපාහ

# පුහුණු තුළින් පරිණත සොල්දාදුවෙකු බිහි කරයි ...



වව්නියාව පම්පෙමඩුහි ස්ථාපිත 17 වන ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් තම ඒකක බළඇණි පුහුණුවීම්වලට සමගාමීව ආධාරක පීව වෙඩිතැබීම් සිදුකිරීම අප්‍රියෙල් මස 03 වන දින කල්පිටිය ගුවන් හමුදා ක්ෂේත්‍ර වෙඩිපිටියේදී සිදුකලේය. ඒකක අණදෙන නිලධාරී මේජර් ඕ ඒ එස් අයි ආර් කේ විතානගේ RSP ගේ අධීක්ෂණය යටතේ නිලධාරියෙකු හා සෙසුනිලයින් 30 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම ආධාරක පීව වෙඩි තැබීම සිදුකරන ලදී.


## 12 ශ්‍රීලංජාආබමු

# 32 වන සංවත්සරය අභිමානයෙන් සැමරූ වගයි...





12 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව තම 32 වන සංවත්සර දිනය මැයි මස 27 වන දින ඒකක මූලස්ථානය පෙරියවඩ්ඩුවාන්, තොප්පිගල හිදී මහත් අභිමානයෙන් යුතුව සමරන ලදී. එදින ඒකකයේ කණ්ඩායම් අතර සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක් පවත්වන ලදී. ඒකකයේ රාජකාරි කර දැයෙන් සමුගත් රණවිරුවන් අනුස්මරණය කිරීම හා රණක්ෂිතයට පත්ව දැනට ප්‍රතිකාර ලබමින් සිටින රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් සංඝගත දානමය පිංකමක් සිදුකර ඔවුන් හට පින්පෙත් අනුමෝදනා කිරීමක් මෙන්ම, දැනට සේවයේ නියුතු සියලුම නිලධාරි හා සෙසුනිලයින් හට සෙත්පතමින් බෝධි පූජා පිංකමක් ද පවත්වන ලදී.



# කලයාණී සිතාසුනාය

යුද්දෙ කාලෙ කතාවක් ....

මිදුලේ කොනක වන් අඹගහ යට වූ බංකුවෙහි හිඳගත් සිරිල් සති තුනක ඇවෑමෙන් ලද කලයාණිගේ හසුන දිගහැරියේ අපමණ සොම්නසකිනි. එදවස ඇගේ ලිපිවල දුටු මුතුවන් අත්අකුරු සොඳුරු බර වදන් මෙන්ම ඇගේ සුවඳද අද වූව එලෙසම නොවේදැයි ඔහුට සිතින. ආදරණීය සිරිල් ! ඔයා එව්ව දෙවෙනි ලිපියත් ලැබුණා. ඒත් අද තමයි පිළිතුරක් ලියන්න ඉඩක් ලැබුනෙ. හිතාමතාම ලිපි ප්‍රමාද කරනව නෙවෙයි මං. ඒ උනත් මේ පරිසරයේදී එහෙම දේකට වෙලාව වෙන් කරන එක හරිම අමාරුයි. මගේ රැකියාවේ තියෙන අවිවේකීබව ඔයාට අමුතුවෙන් කියන්න ඕනේ නෑනේ. ඒ උනත් ඉස්සර වගේ නිතරම ඔයාට ලියන්න නොලැබෙනකොට මගෙ හිතට හරි දුකක් දැනෙනවා. ඔයාගෙන් උනත් ලිපියක් ප්‍රමාද වෙනකොට ඒ දුක තවත් වැඩි වෙනවා. ඒත් මම දන්නවා ඔයාට තියෙන වැඩකටයුතුත් මට දෙවෙනි නැති බව.

ලිපියෙන් මඳකට හිස ඉවතට ගත් සිරිල් මොහොතක් වටපිට බැලුවේ කිසිවකු තමා අසල ගැවසෙන්නේ දැයි සැකහැර දැනගනු රිසියෙනි. කලයාණි එවූ ලිපියක් කියවන සෑම මොහොතකදීම ඇය තමා අසල ගැවසෙන සෙයක් ඔහුට හැඟිණි. හෙතෙම නැවතත් කුතුහලයෙන් යුතුව ලිපිය වෙත නෙත් යොමු කළේය.

ඒක නෙවෙයි සිරිල් මේ පැත්තෙ කලබල වැඩියි. හැම දවසකම මොකක් හරි සිදුවීමක් වෙනව. දැන් මේ පැතිවල කරන මෙහෙයුම් වලින් වැඩිපුර වාසි අපටයි. මෙහෙත් කලක් නොනැවතුණු යුද්දෙක අවසානය ජේනමාගෙ කියලයි මට හිතෙන්නෙ. මොනතරම් දුෂ්කරතා විඳගෙන වුනත් මෙහෙ ඉන්න අපේ කොල්ලො රට වෙනුවෙන් කරන කැප කිරීම දකිනකොට මට ගෑනුකම අමතක වෙන තරම් සිරිල්. කෙල්ලො හැටියට අපි පෙරමුණේ නැතත් අපිට හැකි අයුරින් යුද්දෙට සම්මාදම් වෙනව. ඒත් අපෙත් තවම රට වෙනුවෙන් කොල්ලන්ට සාපේක්ෂව හරි දායකත්වය ලැබිල නෑ කියලයි මට හිතෙන්නෙ. ජීවිතේ පරදුවට තියලා අපේ කොල්ලො කරන මෙහෙයුම් දිහා බැලුවහම අපි කරන්නෙ මොනවද කියලා හිතෙනවා සිරිල්. ඒ අතින් අපේ රටේ වෙන රැකියාවන් කරන කොල්ලන්ට සාපේක්ෂව හමුදාවෙ කෙල්ලෙක් උන එක ගැන මම හොඳටම

ආඩම්බර වෙනවා. ඒකෙ ගෞරවය හිමිවෙන්නේ ඔයාටයි. බිරිඳව යුද්දෙට යවන්න තරම් විවෘත උන සැමියෙක් හැටියට ඔයත් අනෙක් සැමියන්ට ආදර්ශයක් සිරිල්.

මෙහෙ මාත් එක්ක කෙල්ලො ගොඩක් ඉන්නවා. ආ... ඔයාට කියන්න බැරි උනා. ඔයාලගෙ ගම් පැත්තෙ කෙල්ලො දෙන්නෙක්ම මෙහෙ ඉන්නවා. ඒ අය නම් ඔයාව දන්නවලු. යාලුවොත් එකක් එකතු උනාම නම් පාලුවක් දැනෙන්නෙ නෑ සිරිල්. ඒත් හැම කෙනෙක්ම ඔයා ගැන කියල විහිලු කරනවා. මෙහෙ ඉන්න අයගෙන් විවාහ වෙලා ඉන්න එකම කෙනා මම විතරයි. ඒ වුනත් අනිත් හැම කෙල්ලෙක් එක්කම කරට කර වැඩ කරන්න තරම් මට හැකිවීම ගැන මට හරිම සතුටුයි. ඒ අතින් ඔයාගෙ හැම ලියුමකම මාව දිරිමත් කරල එවන වචන ටික මට මහමෙරක් තරම්. ඔයා දන්නවද ජීවිතේ හැමදේකටම ඔරොත්තු දෙන්න මම දැන් පන්නරය ලබලා. ඒක මේ වෘත්තියෙන් ලබපු ආභාසෙ. මෙහෙ කොච්චර කලබල තිබුනත් ඔයා මම ගැන පොඩ්ඩක්වත් බය වෙන්න එපා. ඔයා මට ආදරෙන් හෙවනැල්ලක් වගේ ඉන්නතාක් මට කවදාවත් වරදින්නෙ නෑ කියලා හොඳටම විශ්වාසයි. ඉස්සර මම පොඩි දේටත් ඇඩුවා. ඒත් දැන් එහෙම නෑ. ඒ හැම වෙලාවකදීම හමුදාවෙ කෙල්ලෙක් හැටියට හිතන්න කියල දවසක් ඔයාමයි මට කියල දුන්නෙ.

ලියුම් කියව කියවා හුල්ලලා හරියන්නේ නෑ ලොකු පුතේ. උඹ ආපහු මෝලෙ රස්සාවට පලයන්. නැත්තං වෙන්නේ උඹට හැමදාම ගෑනුන්ගෙ පදේට නටන්නයි."
නොදැනීම අම්මා තමන් ලඟට පැමිණ ඇත. ඇයගේ සැර පරුෂ හඬ හමුවේ ලිපිය කියවමින් සිටි සිරිල්ගේ දෑහැන් බිඳුනි. හමුදාවෙ කෙල්ලෙක් උඹට හරියන්නෙ නෑ සිරිල්. උඹම ටිකක් හිතල බලපන්. උඹ ඉන්නෙ මෙහෙ. ඒකි ඉන්නෙ රට කෙරෝලෙ. යුද්ධ කරනවයි කියල මාස ගනන් ගෙදරින් පිට. උඹ කොහොමද ගෙදරට වෙලා තනියම මේ වැඩ කරන්නෙ. දැන් මේ ගෙදර පිරිමි ගෑනු මාරු වෙලා. ඔන්න ලොකු පුතේ මම නොකිව්වයි කියන්න එපා. උඹලා දරුවෙක් මල්ලෙක් එහෙම හදාගන්න දවසට මට එහෙම බෑ ආව තේවකං කොරන්ඩ. ඒකිට රස්සාව දමලා ගහලා ගෙදර නතර වෙන්න කියපං.

තොර තෝංචියක් නැති අම්මාගේ ගෝරනාඩුව හමුවේ සිරිල් තුළ මතුවූයේ නොඉවසුමකි. හමුදාවේ කෙනෙකු විවාහ කරගැනීම මහා වරදක් බව අම්මා මුල සිටම දැරූ ස්ථාවරය විය. එහෙත් නිතර දෙවේලේ රණවිරුවන්ට සෙත් පතා පන්සලේ පැවැත්වෙන බෝධිපූජා ආදී පිංකම් සියල්ලකදීම අම්මා පෙරමුණ ගෙන ක්‍රියා කරනුයේ "අපේ රට බේරගන්ඩ ඉන්න දරු පැටව් ටිකට රත්නත්තරේම පිහිටයි....." කියමිනි. එහෙත් අම්මාගේ ඒ ප්‍රාර්ථනය තම පුතුගේ බිරිඳ වූ කල්‍යාණිට පමණක් වලංගු නොවන්නේ ඇයිද යන්න ගැටලුවකි.

එයේම උදේ සිට රෑ වන තුරුම ගුවන් විදුලියේ හෝ රූපවාහිණියේ ප්‍රචාරය වන ප්‍රවෘත්ති විකාශයන්ට සවන් දෙමින් හමුදා සාමාජිකයන්ට කිසියම් විපතක් සිදුව ඇත්නම් ත්‍රස්තවාදීන්ට ශාප කිරීමටත් ඉහනිකට බදාගෙන අනේ අපොයි කියන්නටද ඈ පසුබට නොවන්නීය. අම්මාගේ දෙබිඩි පිළිවෙත අප දෙදෙනාගේම අවාසනාවට සිදුව ඇති සෙයකි.

තවදුරටත් එහි රැඳී සිටීමෙන් සිදුවන්නේ අම්මාගෙන් දිගින් දිගටම එල්ලවන රෑවුම් ගෙරවුම් වලට මැදිවන්නට බව වටහාගත් සිරිල් කිසිත් නොදොඩාම නිවසින් නික්මුණි. හෙතෙම වෙල් යාය මැදිකර දිවෙන ගුරු පාර දිගේ ඇවිද යන්නට වූයේ අරමුණකින් තොරවය.

"තාම පවුල ගෙදර ආවෙ නැද්ද සිරිල්" තම නිවස පෙනෙන මානයේ ඇති බෝක්කුව උඩට වී කල්පනාවක නිමග්නව සිටි සිරිල් වෙත පැමිණි විමලේ අසන්නට වූයේ සරදමට මෙනි. තාම නෑ විමලේ සමහරවිට ලබන සතිය දිහාට එයි. මේ දවස් වල එහෙ හරියට යුද්ධෙලු. සිරිල් ඉවත බලාගෙනම පිළිතුරු දුන්නේය.

උඹනම් පුදුම මිනිහෙක්. ගෑනි යුද්දෙට යවලා උඹ මෙහෙට වෙලා ඉන්නවා. විමලෙගෙ ඒ වදන් හී පහරක් ඇනෙන්නාක් මෙන් සිරිල්ට දැනුනි. උඹ හොඳටම දන්නවනෙ විමලේ මම කල්‍යාණිව අඳුනගන්නකොට ඒකි හමුදාවට බැඳිල ඉවරයි. අනික මමත් ඒ තීන්දුව ගන්න හිතනකොට මගෙ වයස පහුවෙලා. ඒ සේරටම වඩා විමලේ, හමුදාවට බැඳෙන්නත් වාසනාව තියෙන්න ඕන. එහෙමනම් මටත් වඩා උඹට තිබුනනෙ හමුදාවට යන්න. මම හිතන්නේ තාමත් උඹේ වයස වැඩි නෑ. සිරිල් එක දිගට කියාගෙන ගියේ විමලේ දෙස තියුණු බැල්මක් හෙලමිනි. හරි හරි ඒ උනාට අපි ගෑනු යුද්දෙට යවලා හම්බකරවන් කන්නේ නෑනේ.



ලුතිනන් කර්නල් සුජිත් චමින්ද වඩිසිංහ
ජනමාධ්‍ය හා මනෝ විද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

# විරුදරු ප්‍රණාම

## වාර්ෂික මූල්‍යාධාර ප්‍රදානය

### 7 (සෙව්)






ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ දී පැවැත්වූ විරු දරු ප්‍රණාම වාර්ෂික මූල්‍යාධාර ප්‍රදානෝත්සවයට සමගාමීව සැරයන් ඒකනායක බී එම් යු කේ, ලාන්ස් කෝප්‍රල් සෙනවිරත්න ජේ එම් එස් එන් , ලාන්ස් කෝප්‍රල් රත්නායක ආර් ඒ බී සී, ලාන්ස් කෝප්‍රල් දසනායක ඩී එස් එම් සහ ඉසෙ අමරසිරි එම් ඒ එච් ඒ එම් වෙත අදාළ ප්‍රේෂණපත් ලබාදීම ඒකක කාර්ය නියුක්ත අණදෙන නිලධාරිණී මේජර් ඩබ්ලිව් සී පෙරේරා USP ගේ සුරතින් පසුගියදා සිදුකරන ලදී.

### 10 ශ්‍රීලංජාආබමු




ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ දී පැවැත්වූ විරු දරු ප්‍රණාම වාර්ෂික මූල්‍යාධාර ප්‍රදානෝත්සවයට සමගාමීව යුද්ධ හමුදා මූලස්ථානයේ ස්ථාපිත 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් කෝප්‍රල් රුවන් චාමර කේ පී සහ ලාන්ස් කෝප්‍රල් ක්‍රිශාන්ත ඩබ් එම් පී වෙත අදාළ ප්‍රේෂණපත් පිරිනැමීම ඒකක දෙවන අණදෙන නිලධාරි මේජර් පී කේ එච් ෆොන්සේකා ගේ සුරතින් පසුගියදා සිදුකරන ලදී.

### 3 (සෙව්) ශ්‍රීලයුකාබ


ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ දී පැවැත්වූ විරු දරු ප්‍රණාම වාර්ෂික මූල්‍යාධාර ප්‍රදානෝත්සවයට සමගාමීව 3(සෙව්) ශ්‍රීලංයුකාබ ට අයත් සෙ/ආර්100089 කාසෙ කුමුදු කුමාරි කේ සී ගේ දයාබර දියණිය වන ඩබ්ලිව් පී හිම්සරා දහම්දි වීරක්කොඩි 2023/2024 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින් සමත් වීම හේතුවෙන්, අදාළ ප්‍රේෂණපත ලබාදීම. අණදෙන නිලධාරිණී මේජර් එච් එච් එච් ද සිල්වා ගේ සුරතින් පසුගියදා ඒකක මූලස්ථානයේදී සිදුකරන ලදී.



9 ශ්‍රීලංජාආබමු

# "රන් වැටෙන් එකෙක්"

## කෘතිය දොරට වැඩුම ...










9 ශ්‍රීලංජාආබමු ඒකකයට අයත් රණවිරු ඇපරල් - යක්කල හි කැපීම් අංශයේ කැපුම්කරුවකු වශයෙන් රාජකාරි කරනු ලබන සෙ/කිවු108900 ලා/කෝ විජිරසිංහ ටී ඒ ටී එස් යන කොනොනි විසින් රචිත රන් වැටෙන් එකෙක් නම් වූ කෘතිය දොරට වැඩුම මැයි මස 02 වන දින රණවිරු ඇපරල් - යක්කල හිදී පැවැත්විණි. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් රණවිරු ඇපරල් - යක්කල හි සේනාවිධායක බ්‍රිගේඩියර් එම් පී ඒ එන් බී මහතුවක්කාර RWP RSP ndc නිලධාරී සහභාගී වූ අතර මෙම ඒකකය නියෝජනය කරමින් අණදෙන නිලධාරී මේජර් ටී එස් පී කුමාර RSP නිලධාරීද සහභාගී විය. තවද මෙම අවස්ථාව සඳහා රණවිරු ඇපරල් අලවිව - අණදෙන නිලධාරී කර්නල් ඩී ඩී වික්‍රමසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් ඇතුළු විශ්‍රාමික සහ දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී විය.

මෙතෙක් යුධ සාහිත්‍යයට අයත් නිර්මාණ බිහි වී ඇත්තේ අතලොස්සකි.එවැනි අවස්ථාවක ඒ පිළිබඳ සෙබල අත්දැකීම් පදනම් කරගනිමින් ලියවුණු කෘතියක් ලෙස මෙම කෘතියේ වටිනාකම තව තවත් වැඩි කරයි.

# කුසලතා විදහාපාමින් ...







13 වන ආරක්‍ෂක සේවා බැට්මින්ටන් තරඟාවලිය මැයි මස 14 දින සිට 18 වන දින දක්වා වැලිසර නාවික හමුදා මූලස්ථානයේදී පවත්වන ලද අතර වයස අවුරුදු 50න් ඉහළ තේවල හා යුගල තරඟ ඉසව්වන්හී රන් පදක්කම් දෙකක් හිමි කර ගන්නට ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවට අයත් ලුතිනන් කර්නල් යූ වී චමින්ද පුෂ්පසිරි ජ්‍යෙෂ්ඨ නිලධාරී සමත් විය.

එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම නියෝජනය කළ එකම ස්වේච්ඡා බලසේනා නිලධාරියා වූ එතුමන් ලබාගත් එම ජයග්‍රහණය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට මෙන්ම ස්වේච්ඡා බලසේනාවටත් ඉමහත් කීර්තියක් වන අතර ලබා ගත් ජයග්‍රහණය වෙනුවෙන් රණවරුණ ඔස්සේ මෙසේ සුභාශිංසන එක් කරන්නෙමු.



# නිර්මාණ අසපුව ...

## අහිමි පෙම

හිසල රැයේදී සාළු සාමරේ
ඔබමයි සිහියට නැඟ එන්නේ
අහිත දිවියේ සැමරුම්
යළි යළි සිහිවන්නේ...

දකින දසුනේ සහන පැතුමේ
නුඹමයි මතකෙට නැඟඑන්නේ
ඒ මතකය හෙතට ඇවිල්ලා
දෑස්පියන් සේදී යන්නේ...

හිමිකර ගන්නට බැරි බව හැඟුනත්
මගේ ලොවේ කුමරිය නුඹ වන්නේ
ජීවිතයම මහ වියළුණු කතරකි
සැමදා කඳුළයි හිමිවන්නේ

සෙ/11ඊ01807
ලා/සෝ චතුරංග එස්පී
11 (සෙව) ශ්‍රීලංසිරෙ

## ගෙවී ගිය වසර දාසය......වෙනුවෙන්

කළ පූජාවක්
විසි දහසකට
අධික පිරිසක්
ඇට මස් ලේ නහර
කෝටියක්......

දමා පිලිගත්තද
රටක් විදියට
ඔවුන් ඔක්කොම
දමා ගෙල මල්
මාලයක්......

මිහිදන් වූයේ ප්‍රාණය
අප සවන් තුළට
එකතු කරමින්
අභිමංසල නාමින්
නාමයක්......

දින සති මාස පසුකර
යුද ගිනි දැල් නිමකොට
මතකය දිගෙ ආවට
අදට නොදැනිම වසර
දාසයක්.....

කපිතාන් ඩබ්ලිව්එච්පී බුද්ධික ගරෙ
නිලධාරි අණදෙන
විශේෂ අධ්‍යාපන හා පුනුණු
අභිමංසල 2 සුවසහන නිකේතනය

## තාත්තා ...

ලෝකයේ හැම ආදරයක්ම හඬ නැඟුවට
එකම එක ආදරයක් තවමත් නිහඬවම
මාත් එක්ක හිදියා.
තාත්තගේ ආදරේ මට මහ මෙරකටවත් උපමා කරන්න බැරි
ආදරයක් ඒ නිසා ඉරට හඳට මම තාත්තව උපමා කරන්නේ නෑ.
මහ දවාලෙත්, රෑ පුරාත්, හදවත පත්ලේ මේ තරම් සෙනෙහසක්
මගේ නමින්ම ලියවෙද්දි තාත්තගේ උරහිසේ හයිය, මගේ වාරුව
උනා. මෙලොව එළිය දුටු දා පටන් මම අනුකරණය කළ.
මම අනුගමනය කළ මගේ ලොකයේ විරයා තාත්තා උණා. අඩන්න
දාහක් හේතු මැවෙද්දි කඳුළු හංගාගෙනම තාත්තා හිනා උනා.
ඒ තරම්ම ඒ හිතේ තිබුණ හයිය. ශක්තිය මහ පුදුමාකාරයි.
දාහක් දේවල් ඉල්ලලා මම අඩද්දි කිසිම දෙයක් අඩුවක් තාත්තා
මට දැනෙන්න දුන්නෙ නෑ.
ඒ දවසේ ඉඳලා අද වෙනකම්ම ඒ ඇහෙන් කඳුළක් වැටෙද්දි
තාත්තා ඒවා මගෙන් හැංගුවා.
ඒ මට දුක දැනෙයි කියලා නේද තාත්තේ.?
තාත්තා ඉන්න හැමතැනකම මට දැනුණේ ලොකු
ආරක්ෂාවරණයක්.
තාත්තාට මේ ලෝකේ කරන්න බැරි දෙයක් නෑ. ඒ තරමට තාත්තා
ගැන මට තිබුනේ ලොකු
විශ්වාසයක් තාත්තා එපා කියපු දෙයක් මම කරන්න ගියොත් එතන
වරදින්න හේතු දහස් ගණනක් තිබුණා.
තාත්තාට අහිමිවුන ලෝකයක් තිබුණා නම් ඒ ලෝකේ
මම රජවෙනවා දකින්න තාත්තා හැමදාකම සිහින මැවුවා,
අම්මාගේ ආදරේ වගේම තාත්තාගේ නිහඬ ආදරය මේ ලෝකය
හැමදාටම ලස්සන කරනවා.
මම ජයග්‍රහණයක් ලබද්දි.
ජීවිතයේ සාර්ථකව ඉස්සරහට යද්දි.
තාත්තාගේ මුහුණේ ඇඳෙන හිනාවේ අමුතුම ලස්සනක් තිබුනා.
ඒකට හේතුව හදවත පතුලේම තියෙන ආදරේ නේද කියලා මට
තේරුනේ මමත් තාත්තා කෙනෙක් වුනාට පස්සේ.
බය වෙන්න එපා තාත්තේ ලොකු පුතා ඉන්නවා හැමදාකම.
තාත්තා හින දැක්ක හැම
හීනයක්ම ලස්සනට
හැමදාකම පාට
කරන්නම්.
සංසාරේ නැවත
උපදින්න වරම්
ලැබුණොත් ඔබේම පුතු
වෙලා ඉපදේවා යන
පැතුම
හැමදාකම මාගේ
ප්‍රාර්ථනයයි.

සෙ/සී101077
කෝප්‍රල් අබේරත්න
ආර් ඩී එස් එස්
2 (සෙව) ශ්‍රීලංසංබ






## ජුලියට් ගෙන් ගුටි කෑ රෝමියෝ

එක්තරා නිලධාරියෙක් දවසක් ගුවන් විදුලි යන්ත්‍රයෙන් සෙබලෙකුට කතා කළා. කොයි තරම් කතා කළත් සෙට්එකට "නෝ ආන්සර්" දුන් ඉතින් නිලධාරියාට යකා නැගලා. තවත් දෙතුන් පාරක් කතා කරන කොට "ඕකේ" එක දුන්නා. ඊට පස්සේ නිලධාරියා ඇහුවා කවුද කතා කරන්නේ කියලා.

සෙබලාගේ නම රත්නායක. "රෝජර් මම රෝමියෝ කතා කරන්නේ ඕවර්" කිව්වා. ඊට පසු නිලධාරියා පැවසුවා "කල්පනාවෙන් හිටපං මං මේ ජුලියට් කතා කරන්නේ සෙට් එකට ඇහුංකං දීගෙන හිටපං" කිව්වා.

ඉන් පසුව රෑ දහයට පමණ ජුලියට් ආවා පොයින්ට් එක චෙක් කරන්න. ඒ එනකොට රෝමියෝ සෙට්එක ඔලුවට තියාගෙන "කපල" ගහලා (නිදි) ජුලියට් රෝමියෝට හොරෙන්ම සෙට්එකත් අරගෙන ඔපිසර්ස් මෙස් එකට ගියා. රෝමියෝ ඇහැරෙන කොට සෙට් එක නැහැ. දැන් රෝමියෝ කරුවලේ වටේ දුවනවා. සෙට්එක හොයන්න. කරුණු සොයා බලන විට ජුලියට් සෙට් එක අරගෙන ගිය බව දැනගත්තා. රෝමියෝ ඇරියෙත් නැහැ. මහ රෑම ගියා ජුලියට් සොයාගෙන. හැබැයි ජුලියට් ඉන්නේ උඩ තට්ටුවක. යන්න ඕනී ඉණිමගෙන්. රෝමියෝ හොරෙන් හොරෙන් නැග්ගා ඉණිමග දිගේ ජුලියට් ඉන්න කාමරයට. රෝමියෝ දැක්කා ලාම්පු එළියට එයාගේ සෙට්එක ජුලියට් ලඟ තියාගෙනම නිදාගෙන ඉන්නවා. රෝමියෝ දැන් යනවා කකුලේ ඇඟිලිවලින් ඉස්සි ඉස්සි. හිමිට සෙට්එක ගන්නකොටම රෝමියෝට මාට්ටු. ඊට පස්සෙ ලැබුණේ ආදරණීය පාරවල් ටිකක් රෝමියෝට. ඔන්න ඕකයි අපේ රෝමියෝ ජුලියට් ගේ ආදර අන්දරය.



## කන්නාඩියේ වැරැද්ද

**සැමියා :** හාමිනේ .. ඔන්න ඔය බිත්තියේ එල්ලපු මූණ බලන කණ්නාඩිය ගලෝල විසි කරල දාල කකුල් දෙකත් පෙනෙන තරමට දිග එකක් ගෙනත් එල්ලන්න

**බිරිඳ :** ඇයි අනේ .. ඔහොම බෙරිහන් දෙන්නේ ? මොකද්ද ඔයාට හැඳුණු කුලප්පුව ?

**සැමියා :** කුලප්පුව නෙමේ මට හරි වැඩේ වෙන්ඩ ගියේ තව පොඩ්ඩෙන්

**බිරිඳ :** ඇයි ඒ මොකද ?

**සැමියා :** තව ටිකෙන් මම එළියට බහින්නේ කලිසම අඳින්නේ නැතුව



## දේවාලය....

ගුරුන්නාසේ මගේ පුතා මේ සැරේ
සාමාන්‍ය පෙළ ලියනවා..
හොඳට පාස් වෙන්න කියලා ශාන්තියක්
කරන්න ඕනේ
ලක්ෂයක් යනවා හැබැයි විෂයන්
නවයටම **A** 9 ක් අරන් දෙන්නම්..
අපෝ ගාන වැඩියි ගුරුන්නාන්සේ
එහෙනම් ගණිතය විද්‍යාව ඉංග්‍රීසි පාස් කරලා
දෙන්නාකෝ අනිත් එවා නම් මෙයාට
එච්චර අමාරු නෑ..
හරි ගණිතය පාස් කරන්න රු 10000 යි
විද්‍යාව පාස් කරන්න රු 10000 යි
ඉංග්‍රීසි පාස් කරන්න රු 20000 යි
ඇයි ගුරුන්නාසේ ඉංග්‍රීසි විෂයට විතරක්
ඇයි ගාන වැඩි ?
ඉංග්‍රීසි පාස් වෙන්න ඉංග්‍රීසියෙන් මතුරන්න ඕනේ
මට ඉංග්‍රීසි බැනේ ඉතින් පරිවර්තකයෙක් ගන්නත්
එක්ක ගාන වැඩියි...

## ප්‍රීතිමත් ජීවිතයකට මගක් ...



"ප්‍රීතිමත් ජීවිතයකට මගක්" යන මාතෘකාව යටතේ හරවත් දේශනයක් මාවනැල්ල මූලික රෝහලේ වෛද්‍යවරයෙකු ලෙස රාජකාරී කරනු ලබන මනෝචිකිත්සක හා මනෝවිද්‍යාත්මක උපදේශක වෛද්‍ය එන් පී පී පී ජයසිංහ මහතා විසින් පැවැත්විය. එහිදී කායික හා මානසික සෞඛ්‍ය නිවැරදිව පවත්වාගෙන යාමෙහි වැදගත්කම හා ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ගේ මගපෙන්වීම මත ස්වේච්ඡා බලසේනා වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් ජගිත් බණ්ඩාර ගේ අධීක්ෂණය යටතේ පැවති මෙම දේශනය සඳහා ස්වේච්ඡා බලසේනා ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.

## විගණන කාර්යයේ වැදගත්කම ...

අප්‍රියෙල් මස 02 වන දිනට යෙදුණු බදාදා පුහුණු දින වැඩසටහන වෙනුවෙන් "ඵලදායී විගණනයක් ක්‍රියාත්මක කිරීම" පිළිබඳ දේශනය ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ මාණ්ඩලික නිලධාරී 1 (මුදල්) මේජර් කේ ඩී එම් කුමාරසිරි විසින් පැවැත්විය. එහිදී සැලසුම් කිරීම, අනුකූලතාව, නිරවද්‍යතාවය, වගවීම සහ සහතික කිරීම සඳහා ව්‍යුහගත ප්‍රවේශයක් අවශ්‍ය වන විගණනයක් පැවැත්වීමේ වැදගත්කම පිළිබඳව පෙන්වා දෙන ලදී.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ගේ මගපෙන්වීම මත ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාරගේ අධීක්ෂණය යටතේ සිදුකළ මෙම දේශනය සඳහා ස්වේච්ඡා බලසේනා ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.

## ප්‍රථමාධාර මගින් රෝගීන් බේරා ගනිමු ...



අප්‍රියෙල් මස 23 වන දිනට යෙදුණු බදාදා දින පුහුණු වැඩසටහන වෙනුවෙන් ප්‍රථමාධාර මගින් ජීවිත බේරා ගනිමු යන මාතෘකාව යටතේ හරවත් දේශනයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ වෛද්‍ය අංශයේ රාජකාරී නියුතු බලලත් නිලධාරී 1 ඩබ්ලිව් එම් ඩී ගුණතිලක විසින් සිදුකළේය.

එහිදී කෘමීන් දෂ්ට කිරීම්, අස්ථි බිඳීම් සහ විෂ ශරීරගතවූ කෙනෙකුට ලබාදෙන මූලික ප්‍රථමාධාර පිළිබඳව දැනුවත් කරන ලදී. මෙම දේශනය සඳහා ස්වේච්ඡා බලසේනා ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

## නොයා යුතු තැන ...



ස්වේච්ඡා බලසේනා මූලස්ථානය බදාදා පුහුණු දින වැඩසටහන වෙනුවෙන් "නොයා යුතු තැන" පිළිබඳ හරවත් දේශනයක් බන්ධනාගාර පුනරුත්ථාපන කොමසාරිස් ජගත් චන්දන වීරසිංහ මහතා විසින් අප්‍රියෙල් මස 30 වන දින පැවැත්විය. එහිදී බන්ධනාගාර ගතවුවන්ගේ දුක් කම්කටොළු විදහා දක්වමින් පෞද්ගලික ජීවිතවලට අභියෝගයෙන් වැදගත්වන කරුණු කිහිපයක් විස්තර කරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ගේ මගපෙන්වීම මත ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාරගේ අධීක්‍ෂණය යටතේ සිදුකළ මෙම දේශනය සඳහා ස්වේච්ඡා බලසේනා ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.

## සන්නද්ධ ගැටුම් පිළිබඳ නීතිය ...



මැයි මස 07 වන දිනට යෙදුණු බදාදා දින පුහුණු වැඩසටහන වෙනුවෙන් "සන්නද්ධ ගැටුම් පිළිබඳ නීතිය" යන මාතෘකාව යටතේ හරවත් දේශනයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ හට කාර්ය සම්පාදන ශාඛාවේ මානි II වශයෙන් රාජකාරී නියුතු මේජර් ජේ පී ටී එස් ජයසිංහ Lsc නිලධාරී විසින් සිදුකළේය.

එහිදී ප්‍රධාන වශයෙන් සන්නද්ධ ගැටුම් පිළිබඳ නීතියේ මූලික මූලධර්ම ඉලක්ක කර ගනිමින් දේශනය සිදු කළ අතර මෙම දේශනය සඳහා ස්වේච්ඡා බලසේනා කර්නල් පුහුණු ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසු නිලයින් පිරිසක් ද සහභාගී වූහ.

## "ක්ලීන් ශ්‍රී ලංකා" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක්...



මැයි මස 15 වන දින "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන පිළිබඳ විශේෂ දේශනයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී 1 (පුහුණු) ලුතිනන් කර්නල් පී ඒ පී ඒ පී මඩිත්තපොල විසින් පැවැත්විය.

එහිදී රටක් ලෙස දූෂණය, වංචාව හා අල්ලසින් මිදී වඩාත් විනිවිදභාවයකින් යුක්තව තම රාජකාරිය උපරිම කාර්යක්‍ෂමතාවයකින් හා ඵලදායිව ඉටුකිරීම මෙම "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනෙන් අපේක්‍ෂා කරන බව පැහැදිලි කළේය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාරගේ අධීක්‍ෂණය යටතේ සිදුකළ මෙම දේශනය සඳහා ස්වේච්ඡා බලසේනා කර්නල් පුහුණු ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසු නිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.

# පුරාණ සිංහලයන්ගේ

## ආහාරපාන සංස්කෘතිය

පැරණි ශ්‍රී ලාංකිකයින්ගේ ආහාරපාන හා ඒ හා බැඳුණු පරිසර හිතකාමී ක්‍රියා පිළිවෙත් සහ ක්‍රමවේදයන් පිළිබඳව දේශීය මෙන්ම විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර තුළද සඳහන් වී තිබේ. මෙම ලිපි මාලාව තුළින් අප එම මූලාශ්‍ර හා සංචාරකයන් සිය අත්දැකීම් තුළ දක්වන අපගේ ආහාරපාන රටාවේ සැඟවුණු සහ ඇතැම් විට අමතකව ගිය සංස්කෘතිකත්වය පිළිබඳව ඔබ වෙත ගෙන ඒමට අපේක්ෂා කරමු. අද වන විට බත් වතීම සඳහා භාවිත කරනු ලබන ලන්චිෂීට් හෙවත් බත් කොළ පරිසරයට මහත් හානියක් ඇතිකර තිබෙන්නේ ඒවා දිරායාම පිළිබඳ ඇති ගැටලු හේතුවෙනි. දිනෙන් දින මානව පරිභෝජනය ඉහළ යාමත් සමග පරිසරයට වන හානියේ ප්‍රමාණයද ඉහළ යමින් පවතී. අතීතයේදී මානව ප්‍රජාව මේ සඳහා භාවිත කරන ලද ක්‍රමවේදය කුමක් වන්නට ඇත්ද? රොබට් නොක්ස් "එදා හෙළදිව" ග්‍රන්ථය තුළ පුවක් අත්තේ දෙපසට බෙදී සෑදී ගිය පතුවලින් නිර්මාණය කරන ලද කොළඅව හෙවත් කොළපත පිළිබඳ සටහන් කොට ඇත්තේ. "මෙම කොළපත්වල පිට සිවිය පලා ගත් කල්හි විවිධ ප්‍රයෝජනවලට ගත හැක. ආහාර මුල් බැඳගෙන යාමටද, ආහාර භුක්ති විඳීමටද භාවිත කරනු ලැබේ. දියර සහිත ආහාර ව්‍යාංජනයක් වුවද මෙම කොළපත මැදින් නවා දෙපසින් හකුලා බෑගයක් හෙවත් පසුම්බියක් ලෙස තනාගත් කල්හි ගෙන යා හැක". එකල පුවක් අත්තක් ඉදී වැටෙන පරක්කුවට කොළපත කපා වෙන් කර ගැනීමට ගෙවිලියන් යුහුසුලු විය. ඊට හේතුව වූයේ ගෘහණියට මෙන්ම ගෙදර ගෘහණියට කොළපතින් බොහෝ ප්‍රයෝජන තිබීමයි. මුලුතැන්ගේ කොළපත් තැබීම සඳහා වෙනම ස්ථානයක් පවා එකල තිබිණි. නමුත් බ්‍රිතාන්‍යයන් ඇතුළු යුරෝපීය ආගාශය මගින් මෙරටට පැමිණි කාර්මීකරණයේ රැල්ලට කොළපත ගසාගෙන ගොස් ප්ලාස්ටික් භාවිතයට මෙරට ජනයා පුරුදු වූහ. කොළපත විටෙක කුණු එකතු කරන්නක් විය. වර්තමානයේ අප **Dust pan** ලෙස උපකරණයක් ප්ලාස්ටික් වලින් සාදාගෙන භාවිතා කරයි. පැරණි ගෘහණිය ගොම මැටි ගෑ ගෙබිමේ සහ මුලුතැන් ගේ ඉතිරිවන දෑ ඉලපතින් අතුගා ඉවතලන රොඩුබොඩු එකතු කරන්නේද කොළපතටය. කොළපත නවා ඒවා මැද්දට කුණුරොඩු විසිකළ පසු කොළපත සමගම පොළවට දිරාපත් වන්නේය. වෙද ගෙදරක බෙහෙත් ඖෂධ කොළ, පොතු, මුල්, මල්, ගෙඩි යන පංචාංගය එක්කාසු වූයේද කොළපතටය. වෙදමහතුන් වනාන්තරයෙන් ලබාගන්නා කොළ පොතු මුල් ආදිය වෙද ගෙදරට ගෙන ගියේද කොළපතකය. ගව පාලනයේදී එළදෙනුන්, හරකුන් ඇති කරන විටදී කැපූ කෙත් හා වෙනත් එළවළු වල ඉවතලන කොටස් සහ කැපූ තණකොළ සතුන් වෙත ගොස් දීමටද භාවිත කර ඇත්තේ කොළපතයි. අතීතයේදී වී වගා කිරීම, කුඹුරුවලට අමතරව හේන්වලද සිදු කර තිබේ. එම හේන් හඳුන්වන ලද්දේ ඇල්හේන් වශයෙනි. ඇල්හේනේ ගොයම් කැපීමෙන් පසු එහි පළමු උප්පිඩෙන් ගනු ලබන අස්වැන්නෙන් කොළපත් මුල් දෙකක් සකසා ඊට දමා එයින් පසුව අඟුරු කැබැල්ලකින් එහි අත් යනුවෙන් ලියා එල්ලා තබයි. එසේ සිදු කරන්නේ නෑ යකුන් හෙවත් ආදී මුතුන් මිත්තන් නැතිනම් කොහොඹයන් උදෙසායි. එසේ වැඳුම් පිදුම් නොකලහොත් කොහොඹයන් අස්වැන්න සඳහා හානි පමුණුවන බව පාරම්පරික ගොවීන් විශ්වාස කරනු ලබයි. සාමාන්‍ය කුඹුරක ද, මේ චාරිත්‍රය කොළපත යොදාගෙන සිදු කරන අතර, එහිදී කොළපත් මුල වෙන්කර තබනු ලබන්නේ බුදුන් හා දෙවියන් සඳහායි. කිතුල් මලින් ගන්නා මුල පැණි වත්කොට



දෙවියන් උදෙසා තබන අතර එයද කොළපත් පට්ටයකින් මසා එහි දෙපසට පුහුන් යොදා තෙලිදිය අඩුවූ විට එය වත්කොට දුමේ එල්ලා තබනු ලැබේ. එමගින් ඇති වන එක් වාසියක් නම් කොතරම් කල් වුවද පැණි උතුරා නොයාමයි. අනෙක් වාසිය නම් ඒවා වසරකින් පමණ වැලි හකුරු බවට පත්වන අතර වැලි හකුරු අපගේ පැරණි කල්තබා ගැනීමේ ක්‍රමයකි. වසර දහයක් ගියද ඒවා නරක් නොවේ. එබැවින් වර්තමානයේ අප භාවිතා කරන කල්තබා ගැනීමේ ක්‍රමවලට සාපේක්ෂව වඩා පරිසර හිතකාමී ක්‍රමයකි. මීට අමතරව ගැමියන් කඩවලින් මිලදී ගන්නා පරිප්පු, කරවල ආදිය කොළපතින් සකස්කරගනු ලැබූ ගොටුවක බහා තබා මුලුතැන්ගෙයි දුමෙහි එල්ලා තැබූ අතර එමගින් කෘමීන්ගෙන් හා දිලීර මගින් ආහාර සඳහා සිදුවන හානිය වළක්වා ගන්නා ලදි. කොළපත විටෙක වැසි දිනයට කුඩයක් වූ අතර තවත් විටෙක හේනේ කොරටුවේ පැළවලට ජලය දැමීම පහසු කරන ජල භාජනයක්ද විය. වර්තමාන ජීවන රටාව තුළ හා විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයට මූලිකත්වයක් ලබා දෙනු ලබන රටක් ලෙස මෙරට ආහාරපාන සංස්කෘතියට වැදගත්වන අංගයක් ලෙස කොළපත හඳුනා ගැනේ. විශේෂයෙන් ආහාරපාන පිළිගැන්වීමේදී (Food and beverage services) කොළපතින් මහත් ප්‍රයෝජනයක් ගත් අතීත ගැමියාද කැති කොස් හෙරලි වැනි ආහාර පානවලින් පංගුවක් අසල්වැසි නිවසකට ගෙන ගොස් දෙන්නේ කොළපතක ලෑමෙනි. එමෙන්ම ගොයම් කැපීමකදී, අත්තම් දීමකදී කොළපත කපා පිඟානක් සේ සකස් කොට ආහාර බෙදා දෙයි. සිය ස්වභාවික ඇල්හේනේ පැල් රකින විට ඇඹුල ගෙන යන්නේ කොළපතක බැඳීමෙනි. එකල කාන්තාවන්ට හේනට ඇතුළුවීම තහංචි වූ බැවින් ගෙවිලිය ඇඹුල කොළපත් ගොටුවක ලා ලබු සෑයක වතුර දමා දඬුවැටේ හෝ බැලුම් කනුවේ එල්ලා දඬුවැට සොලවා සැමියාට සංඥා කරනු ලබයි. අතීත සංචාරකයන් සිය සංචාරවලදී අප පෙර සඳහන් කළ පරිදි (අනුරාධපුර, සීගිරිය, ශ්‍රී පාදය) ආහාර ගෙන ගියේ කොළපතකය. එනම් ආහාර වැඩි කාලයක් නරක් නොවී තබා ගැනීමට කොළපත ඉවහල් වී තිබේ. මහාවංශයේ දැක්වෙන සිරිසඟබෝ කතාවේ හිස දන් දුන් දුගියාගේ බත්පත සහ උම්මග්ග ජාතකයේ තලතා දේවියගේ නුවණ විස්තර කරන අවස්ථාවේ ඇය විසින් විසඳූ ගැටලුවේ ඇතුළත් වන මහියාගේ බත්පත ඊට උදාහරණ ලෙස අපට හඳුනාගත හැක. සංචාරක ව්‍යාපාරය මේ වන විට මුහුණ දෙනු ලබන ප්‍රධානතම අභියෝගයක් නම් ඩොලර් නැවත පිට රටට ගලායාමයි (**Leekage**) එයට හොඳම විසඳුමක් වන්නේ හැකිතාක් දේශීය නිෂ්පාදන සහ දේශීය තාක්ෂණයට මූලිකත්වය ලබා දීමයි. සංචාරකයන්ට කොළපත අකැප විය යුතු නැත. දේශීය හා විදේශීය සංචාරකයන්ට ආහාර කොළපතක අසුරා තිබීම පාරිසරික හිතකාමී පියවරක්ද වනු ඇත. එවිට පොලිතීන් භාවිතයත් සමඟ කඳු ගණන් ගොඩගැසෙන පොලිතීන් ප්‍රමාණයද ක්‍රමයෙන් අඩුවී වඩා සුන්දර පරිසරයක් නිර්මාණය කර ගැනීමට අපට හැකිවනු ඇත.



කථිකාචාර්ය
රන්දුනු විදුල සොයිසා
MBA (Gloustershira - UK)
BA (SP) (Usjp)
Post Graduate Dip in Tourism & Hospitality Management (Othm)







## දිවියට සුවයක් තුළින් මෙවර ඔබට ගෙන එනුයේ

# පාදයේ වේදනාව





පහළ ගාත්‍රයේ විලුඹේ සිට පා ඇඟිලි දක්වා වූ ප්‍රදේශය පාදය ලෙස හැඳින්වෙන අතර එය පාර්ෂ්ණි අස්ථිය (**Calcainus Bone**) නම් වූ විලුඹ සාදන විශාල අස්ථියකින් හා සාපේක්ෂව කුඩා වූ අස්ථි කැබලි 25 කින්ද ඉතා ශක්තිමත් හා පාෂ්ටිමත් පේශි තුනකින්ද රුධිර වාහිනී හා ස්නායුවලින් සමන්විත වේ.

ඇවිදීම, දිවීම, පැනීම, බර ඉසිලීම ආදී ක්‍රියාවලදී ඇතිවන කම්පනය හා පීඩනය දරා ගැනීම උදෙසා මෙම අස්ථි චක්‍රාකාර (**Arch**) හැඩයකට පිහිටන අතර එම සෑම අස්ථියක්ම සෙලවීමට හැකිවන පරිදි බන්ධනී හා පේශිවලින් එකිනෙක බැඳී පවතී.

පමණ ඉක්මවා ක්‍රියාකාරීවීම, කකුල පෙරළීම, උසක සිට වැටීම හෝ පැනීම, යම් දෙයක ගැටීම, යමක් වැදීම යනාදිය හේතුවෙන් පාදයේ අස්ථි බිඳීයාම හෝ පේශිවල අභ්‍යන්තර තුවාල සිදුවීම සුලභව දැකිය හැකි අතර එහිදී අධික වේදනාව, චලනයේ අපහසුව, ඉදිමීම, රතුවීම ආදී ලක්ෂණ පෙන්වයි. පාදය නිර්මාණය කරන පේශි, අස්ථි හා බැඳුණු ස්ථානවල ඇතිවන අභ්‍යන්තර තුවාල සුව වීමේදී අනවශ්‍ය ලෙස කැල්සියම් තැන්පත්වීම හේතුවෙන් අස්ථි හා පේශිවල චලනය සීමාවීම නිසා පාදයේ වේදනාව දීර්ඝකාලීනව පැවතීමද සුලභව දැකිය හැකි අතර එය හෝමෝනමය බලපෑම හේතුකොට ගෙන පුරුෂ පක්ෂයට වඩා ස්ත්‍රී පක්ෂය අතර වැඩිපුර දක්නට ලැබේ.

මෙයට අමතරව **OstieoArthaitis** වැනි දිගුකාලීන රෝග හේතුවෙන්ද අධික වේදනාවක් පාදයේ ඇතිවන අතර එහිදී පාදයේ හැඩය පවා වෙනස් වීමේ ලක්ෂණය දක්නට ලැබේ.

### රෝග ලක්ෂණ හා ප්‍රතිකාර

අධික වේදනාව, ඉදිමීම, රතුවීම, චලනයේදී වේදනාව වැඩිවීම හා ස්ථානීය උෂ්ණත්වය ඉහළ යාම

මෙහිදී බොහෝ විට අස්ථි බිඳීමක් හෝ ඉදිරීම් ආසාදනයක් විය හැකි නිසා ඉක්මනින් වෛද්‍ය ප්‍රතිකාර කරා යොමු විය යුතු වේ.

වැටීමක් හෝ පෑලීමක් නිසා එම අවස්ථාවේදීම සිදු වූ දෙයක් නම් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්නා තුරු

ඉතිරි කොටස 35 වෙනි පිටුවට ....

# විරු උපහාර



සේවාභිමානී පදක්කම

2009.05.19 දින සිට පශ්චාත් යුධ ක්‍රියාකාරකම් සඳහා දායක වූ මූලික පුහුණු පාඨමාලා කාලසීමාව හැර වසර 06 කට නොඅඩු ගණනීය සේවා කාලයක් සපුරා ඇති, හැසිරීම හා පැවැත්ම සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ යුද්ධ හමුදාවේ ස්ථිර සහ ස්වෙච්ඡා බල හමුදාවන්හි සියළු නිල දරන්නන් හට 2019.10.21 දින සිට මෙම පදක්කම පිරිනමනු ලබයි.



සේවා පදක්කම

2009.05.19 දින සිට පශ්චාත් යුධ ක්‍රියාකාරකම් සඳහා දායක වූ මූලික පුහුණු පාඨමාලා කාලසීමාව හැර වසර 03 නොඅඩු ගණනීය සේවා කාලයක් සපුරා ඇති, හැසිරීම හා පැවැත්ම සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යුද්ධ හමුදාවේ ස්ථිර සහ ස්වෙච්ඡා බල හමුදාවන්හි සියළු නිල දරන්නන් හට 2019.10.21 දින සිට මෙම පදක්කම පිරිනමනු ලබයි.

# සුබ මොහොතින් නව තනතුරු ලැබ ...



Inspector Of Training
HQ SLAVF
Brigadier
B J Lekamge RSP KSP



Brigadier Coord SFHQ (C)
Brigadier
N Mahawithana KSP



Commanding Officer
Sri Lanka Army
Catering Battalion
Colonel
D D A Krishantha



SO 1 (Comdt Sect)
HQ SLAVF
Lieutenant Colonel
W A N S K Weerakkodi
RWP RSP psc



SO 1 (A Branch)
HQ SLAVF
Lieutenant Colonel
D G W M S P Wijekoon psc



SO 1 (Log Branch)
HQ SLAVF
Lieutenant Colonel
J P K Jayatilaka Lsc



SO 1 (Welfare)
HQ SLAVF
Lieutenant Colonel
G S S Galagedera



Commanding Officer
2 (V) GW
Lieutenant Colonel
A M N Wijerathne RSP



Commanding Officer
2 (V) SLSR
Major
K C Yaparathne



Commanding Officer
14 (V) GW
Major
L M Suranga



Commanding Officer
2 (V) GR
Major
G A Sithara



GSO 2 G Branch
HQ SLAVF
Major
W D M K Wickramasinghe



SO 2 (Log Branch)
HQ SLAVF
Major
D M Wijesinghe



Regimental
Sergent Major - 2 (V) GR
WO 1 K M G Aruna
Bandara



Regimental
Sergent Major - 10 (V) GR
WO 1 H M H K Herath



Regimental
Sergent Major
1 SLACAL
WO 1 S S Lasantha

# සුබ මොහොතින් නව තනතුරු ලැබූ ...



Chief Cleark
Log Branch - HQ SLAVF
WO II Abeykoon P N F



Drill Instructor
3 (V) SLAWC
WO 2 Siromila J M M



5 (V) SLLI
Chief Cleark
S/Sergent Suranga A V M S



Chief Cleark - 9 SLNG
S/Sergent Rathnayeka
R M L P

32 වෙනි පිටුවෙන්....

# පාදයේ වේදනාව

වෛද්‍ය විද්‍යාත්මකව අනුමත කර ඇති ප්‍රථමාධාර භාවිතා කළ හැක.

- REST - චලනය සීමා කර පාදය විවේකීව තැබීම
- ICE - අයිස් කැබලි දැමූ මල්ලක් මගින් විනාඩි 15ක් 20ක් පමණ එම ස්ථානය සිසිල් කිරීම
- COMPRESS - වෙළුමක් යොදා සෙලවීම අවම කිරීම
- ELEVATE - පාදය ඔසවා තැබීම

## උදෑසන ඇතිවන වේදනාව

මෙහිදී විවේකීව සිට ක්‍රියාකිරීම පටන් ගත්විට වේදනාව හටගැනීම දක්නට ලැබේ. බොහෝ විට උදෑසන අවදි වී පාදය බිම තබන විට වේදනාව හටගනී. එවිට:

- රෙදි කඩක් උණුසුම් කර තැවීම
- පාදය අතින් සම්බාහනය කර ව්‍යායාම, චලන ලබාදීම
- උදෑසන හා සවස පාදයට ව්‍යායාම ලබාදීම
- උණුසුම් වතුර බෝතලයක් බිම තබා පාදයේ පතුලෙන් වය රෝල් කිරීම ආදිය කළ හැක.
- නින්දට යාමේදී ඇතිවන පාදයේ වේදනා

මෙහිදී පමණට වඩා පේශීන් ක්‍රියාකිරීම හා අස්ථි අතර චලනය සිදුවීම හේතුවෙන් වේදනාව හටගනී.


- උණුසුම් ජල බඳුනක පාදය විනාඩි 15ක් 20ක් පමණ තබා ගැනීම
- උණුසුම් රෙදි කඩකින් පාදය උණුසුම් කිරීම
- වේදනා නාශක ආලේපන ඇත්නම් ගැල්වීම
- පාදය සම්බාහනය කිරීම
- පාදයට විවේකය ලබාදීම
- ශරීරයට වඩා උසින් පාදය ඔසවා තැබීම කළ හැක

## පාදයට ඇතිවිය හැකි අනතුරු වලක්වා ගැනීම

- පමණ ඉක්මවා ක්‍රියාකාරී නොවීම
- පතුලටම පීඩනය හා කම්පනය දැණෙන ක්‍රියාවලදී නිවැරදි ක්‍රම අනුගමනය කිරීම
- නිවැරදි හැඩය ඇති පාවහන් පැළඳීම
- ශරීරයේ බර ප්‍රමාණවත් පරිදි පවත්වා ගැනීම
- රුධිරගත කොලෙස්ටරෝල් මට්ටම නිවැරදිව පවත්වා ගැනීම
- රුධිරගත සීනි මට්ටම පාලනය කර ගැනීම
- අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම (safety shoes)



ඩනි 1 ඩබ්ලිව් එම් ඩී ගුණතිලක
වෛද්‍ය අංශය
ශ්‍රීලංයුහසේවබමු




# ප්‍රහේලිකාව

## 20

### හරහට

1. ඉතා ඉහළ පෝෂණ ගුණයක් සහිත දේශීය ධාන්‍ය වර්ගයකි.
3. ජාති ආගම් භේදයකින් තොරව පොදුවේ වන්දනා කරන සිද්ධස්ථානයකි.
6. පොළොන්නරු යුගයේ රචිත සම්භාවනීය පද්‍ය ග්‍රන්ථයකි.
11. 2022 වර්ෂයේ ***FIFA*** පාපන්දු කුසලානය දිනූ රට වන්නේ.
14. බමුණා යන්නට සමාන පදයකි.
15. බංගලාදේශයේ භාවිතා කරන මුදල් ඒකකය වේ.
16. ළමයින් අතර ප්‍රසිද්ධ කාටූන් චිත්‍රපටියකි.

### පහළට

1. සීඝ්‍ර තාක්ෂණික දියුණුවක් සහිත නැගෙනහිර ආසියාතික රටකි.
2. කරඳිය මගින් .... නිෂ්පාදනය කරයි.
4. මානව ... සහිත මිනිසුන් සමාජයට ආශිර්වාදයකි.
7. මිතුරා යන්නට සමාන පදයකි.
8. වසා පද්ධතියේ ඇත්තේ වසා ...... යයි.
9. කාන්තාවන් දෙනෙත් අලංකරණය සඳහා යොදා ගන්නේ ....... යි.
10. තවත් කෙනෙකු වසඟයට ගැනීම සඳහා මෙය භාවිතා කරයි.
12. ශ්‍රීපාදස්ථානය බුදු හිමියන්ගේ....... ස්පර්ශය ලද ස්ථානයකි.
13. යුරෝපා සංගමයට අයත් රටවල භාවිතාවන මුදල් ඒකකය වේ.

# යුග දිවියට සුබ පැතුම්



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
සෙ/කියු108522 සාසෙ කුමාර ඩබ්ලිව් ටී අයි එස්
6 ශ්‍රීලංජාආබමු හා අචිනි සාගරා මෙනෙවිය





පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
ඔබි 1 බි එම් තුෂිත කුමාර 12 (සේවා) ශ්‍රීලංජාආබමු
හා ඩබ්ලිව් ඒ අනුෂ්කා ඉමාලි මෙනෙවිය

## දිවියට වදනක්

ඔබට කළ හැකි දේ
මට කළ නොහැක
මට කළ හැකි දේ ඔබට
කළ නොහැක
එහෙත් අප දෙගොල්ලන්ම
එක් වුවහොත් කිසිවෙක් හට
කළ නොහැකි දෙයක්
කළ හැකිය

තෙරේසා මව්තුමිය



Don't wait for the
**PERFECT MOMENT**
Take the moment and make it
**PERFECT**

"හෙට දින කුමක් සිදුවේදැයි
ඔබ නොදන්නා බැවින්
කිසිදිනක
බලාපොරොත්තු නැති කර
නොගන්න."



# Happy Birthday



හයවන වියට පා තැබූ
රිෂිදු අවිහාර පුතුට
සුබ පැතුම් පතන්නේ පියා
කෝප්‍රල් අබේරත්න ආර්බීඑන්
සහ මව ඇතුළු පවුලේ සැම



පළමුවන වියට පා තැබූ
ඉසදි මෙනායා ශයෙලි දියණියට
සුබ පැතුම් පතන්නේ පියා
ලා/කෝ උදයන්ත එච්එම්එස්
සහ මව ඇතුළු පවුලේ සැම



හතරවන වියට පා තැබූ
කුෂාන් මෙත්සිත් පුතුට
සුබ පැතුම් පතන්නේ පියා
කෝප්‍රල් ද සිල්වා කේඩබ්ලිව්එස්එන්ටීඊ
සහ මව ඇතුළු පවුලේ සැම



තුන්වන වියට පා තැබූ
රිතුක අමිශ මිනොල් පුතුට
සුබ පැතුම් පතන්නේ පියා
ලා/කෝ සඳරුවන් කේපී
සහ මව ඇතුළු පවුලේ සැම



තුන්වන වියට පා තැබූ
තරිඳු රණවික බංඩාර පුතුට
සුබ පැතුම් පතන්නේ පියා
ලා/කෝ ප්‍රියන්ත කුමාර එන්පී
සහ මව ඇතුළු පවුලේ සැම



දොළොස්වන වියට පා තැබූ
දම්සිලුණි මිනුම් විහන්සා දියණියට
සුබ පැතුම් පතන්නේ පියා
ලා/කෝ ද සිල්වා ඊටීඑන්කේ
සහ මව ඇතුළු පවුලේ සැම



පළමුවන වියට පා තැබූ
පමිතු නෙකේසර පුතුට
සුබ පැතුම් පතන්නේ පියා
ලා/කෝ පෙරේරා එස්එස්
සහ මව ඇතුළු පවුලේ සැම



දෙවන වියට පා තැබූ
මේනුල් මිහන්ස පුතුට
සුබ පැතුම් පතන්නේ පියා
ලා/කෝ ඇතුගල්පිටිය ඊඑන්එම්
සහ මව ඇතුළු පවුලේ සැම



තුන්වන වියට පා තැබූ
පර්නිපා දුහඳි දියණියට
සුබ පැතුම් පතන්නේ පියා
ලා/කෝ කුමාර ආර්එම්පීපීඊ
සහ මව ඇතුළු පවුලේ සැම

# දුටු නුදුටු අතීත මතක ...



ලංකා පාබල හමුදා කුසලානය හා කාගිල්ස් අභියෝගතා කුසලානය දිනාගත්
ලංකා සැපයුම් සහ ප්‍රවාහන කණ්ඩායමේ ඡායාරූපයක් - 1931

## අධීක්ෂණය



මේජර් ජෙනරාල් බී එම් ආර් ජේ බණ්ඩාර

## උපදේශකත්වය



බ්‍රිගේඩියර්
බී ජේ ලේකම්ගේ RSP KSP



කර්නල්
ටී එස් බී ආර් ප්‍රනාන්දු

## සංස්කාරක



ලුතිනන් කර්නල්
එන් ඩබ්ලිව් දහනායක ශ්‍රීලංජෝආබමු


## රණවරුණ කාර්ය මණ්ඩලය

වනි II ජයතිලක ඊඩීඑච්ආර් (සම්බන්ධීකරණය)
කෝප්‍රල් කිරිතිරත්න ඩීඩබ්ලිව්එස්එච් (පරිගණක නිමැවුම්)
ලා/කෝප්‍රල් මෛත්‍රීවර්ධන බීසීජේ (පිටු සැකසුම)
ලා/කෝප්‍රල් බංඩාර පී පී සී ආර් ඩබ්ලිව් (පිටු සැකසුම)
ලා/කෝප්‍රල් ප්‍රියන්ත කුමාර (පිටු සැකසුම)
ලා/කෝප්‍රල් චාමර එම්සේආර්එල් (ඡායාරූප)
ලා/කෝප්‍රල් ඇතුගල්පිටිය එච්ඒඑම් (ඡායාරූප)
පාසෙ වීරතුංග ටී කේ



රණවරුණ ලිපිනය

සංස්කාරක,
රණවරුණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය
යුද්ධ හමුදා කඳවුර,
සීතාවක - කොස්ගම

ඊමේල් - ranawaruna@yahoo.com
දුරකථන - 036 2255 362
වෙබ් - slavf@army.lk



මුද්‍රණය
වයිට් හැකල් මුද්‍රණාලය

# සීතාවකට අංගසම්පූර්ණ ක්‍රිකට් ක්‍රීඩාංගණයක්
# ස්වේච්ඡා බළසේනාවට ශක්තියක්



# "රොන්ඩේව්" ක්‍රිකට් ක්‍රීඩාංගණය විවෘත කළ වගයි ...





සීතාවක ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කඳවුර තුළ ස්ථාපිත "රොන්ඩේව්" ක්‍රීඩාංගණය ක්‍රිකට් ක්‍රීඩාංගණයක් ලෙස නවීකරණය කර උත්සවාකාරයෙන් විවෘත කිරීම අප්‍රියෙල් මස 08 වන දිනට යෙදුණු සුබ මොහොතින් වර්තමාන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් බී කේ ජී එම් එල් රොද්‍රිගෝ RSP ctf-ndu psc IG විසින් සිදුකරන ලදී. එතුමන් ස්වේච්ඡා බළසේනා සේනාවිධායක ලෙස රාජකාරි කල කාලය තුලද මෙම නවීකරණ කටයුතු සඳහා සිය දායකත්වය සැපයීම විශේෂත්වයකි. මේ අවස්ථාව සඳහා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩී කේ එස් කේ දොලගේ USP nps psc ජ්‍යේෂ්ඨ නිලධාරී තුමන් ඇතුලු ජ්‍යේෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන්වරුන්ද, ශ්‍රී ලංකා ක්‍රිකට් ජාතික සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධානී කමල් ධර්මසිරි, රාගම ක්‍රිකට් සමාජයේ සභාපති රොෂාන් ඉද්දමල්ගොඩ යන මහත්වරුන්ද සහභාගී වූහ.